**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**නීතිවේදී උපාධි පාඨමාලාව - 3 වන මට්ටම**
**අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය II- 2021/2022**
**LLU3703- ශ්‍රී ලංකාවේ නීතිය පිළිබඳ හැඳින්වීමක්**
**කාලය - පැය එකයි. (01)**

---

**දිනය - 2022.11.11** **වේලාව - පෙ.ව. 09.30 - පෙ.ව. 10.30**

---

**එක් ප්‍රශ්නයකට පමණක් පිළිතුරු සපයන්න.**
**අපැහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.**

01. "1799 සැප්තැම්බර් 23 ප්‍රකාශනය අනුව ව්‍යවස්ථාදායකය විසින් සිදු කරනු ලබන වෙනස්කම්වලට යටත්ව රෝම ලන්දේසි නීතිය ශ්‍රී ලංකාවේ පොදු නීතිය වශයෙන් පවතී. කෙසේ වුව ද ඇතැම් අවස්ථාවල අධිකරණ තීන්දු මගින් විවිධ ඉංග්‍රීසි නීති මූලධර්ම එක් කරමින් අධිකරණ ඉහත කී තත්ත්වයෙන් වෙනස්ව කටයුතු කර ඇත."

ඉහත ප්‍රකාශය සමඟ ඔබ එකඟ වන්නේ ද? අධිකරණ තීන්දු මගින් ඉංග්‍රීසි නීති මූලධර්ම අපගේ නීති ක්‍රමයට හඳුන්වා දුන් අවස්ථාවන් සාකච්ඡා කරන්න.

02. කාර්තික් 1980 දී කැනඩාවේ උපත ලැබුවේ ය. ඔහුගේ දෙමාපියන් යාපනයේ ද්‍රවිඩ අය වූහ. ඔහුට වයස අවුරුදු 10 දී ඔවුන් නැවත ලංකාවට පැමිණි අතර යාපනයේ පදිංචි වූහ. ඔහුගේ පාසල් අධ්‍යාපනය යාපනය හින්දු ජාතික පාසලෙන් ලබා ගත්තේ ය. පාසල් අධ්‍යාපනයෙන් පසුව උසස් අධ්‍යාපනය ඔහු කැළණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වී සම්පූර්ණ කළේය. පසුව ඔහු බම්බලපිටිය DPC බැංකුවේ සහකාර කළමනාකරුවෙකු ලෙස බැඳුනේ ය. වසර 2005 දී කාර්තික් එම බැංකුවේ ම සේවය කළ සුසරිතා සමඟ විවාහ විය. ඇය යාපනයේ උපත ලැබූ තැනැත්තියක වූ අතර ඇගේ දෙමාපියන් ද යාපනයේ ද්‍රවිඩ අය වූහ. විවාහයෙන් අනතුරුව ඔවුන් සුසරිතාගේ දෙමාපියන් විසින් ඔවුනට ත්‍යාග කරන ලද කිරුළපන පිහිටි නිවසක වාසය කළහ. එම විවාහයෙන් ඔවුනට අන්බිහායි සහ අනබහාන් නම් දරුවන් දෙදෙනකු ලැබුණි. 2010 වසරේ දී සුසරිතා යාපනය ශාඛාව වෙත ස්ථාන මාරුවක් ලබා ගත් අතර කාර්තික් ද යාපනය ශාඛාව වෙත ස්ථාන මාරුවක් ගැනීමට උත්සාහ කළ ද එය සාර්ථක නොවීය. පසුව සුසරිතා සහ දරුවන් යාපනයට ගිය අතර කාර්තික් ගේ දෙමාපියන් සමඟ වාසය කළහ. කාර්තික් කොළඹ සිටියේය. ඉන් පසුව 2015 දී කාර්තික් යාපනයේ, මල්ලාවිහි නව නිවසක් ඉදිකල අතර සුසරිතා සහ දරුවන් සමඟ ඔහුගේ දෙමාපියන්ට එහි වාසය කරන ලෙස ඉල්ලා සිටියේ ය. ඉන් අනතුරුව, කාර්තික් ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ චේතනාවෙන් නුගේගොඩ ඉඩමක් මිලදී ගත්තේ ය. ඔහු නිතිපතා ඔහුගේ භාර්යාවට සහ දරුවන්ට මුදල් යැවූ අතර සෑම මසකට වරක්ම ඔහුගේ පවුල බැලීමට යාපනයට යාමට පුරුදුව සිටියේ ය. 2021 දී ඔහු යාපනයට ගමන් කරමින් සිටින අතරතුර සිදු වූ හදිසි රිය අනතුරකින් කාර්තික් මරණයට පත් විය.

(අ) කාර්තික් පාලනය වන්නේ තේසවලමේ නීතියෙන් ද? නැතිනම් සාමාන්‍ය නීතියෙන් ද? යන්න දැන ගැනීමට සුසරිතාට අවශ්‍යව ඇත. ඇයට උපදෙස් දෙන්න.

(ආ) කාර්තික් උපත ලබන්නේ සහ ඔහුගේ පවුල වාසය කළේ ත්‍රිකුණාමලයේ නම් ඔබගේ පිළිතුර වෙනස් වන්නේ ද?

**හිමිකම් ඇවිරිණි.**